**විවිධ විදේශාධාර ව්‍යාපෘතිය (ප්‍රංශ රජයේ මූල්‍ය පැකේජය යටතේ පාලම් 46 ක් ප්‍රතිසංස්කරණය කිරීම) -2013**

---

විවිධ විදේශාධාර ව්‍යාපෘතියේ (ප්‍රංශ රජයේ මූල්‍ය පැකේජය යටතේ පාලම් 46 ක් ප්‍රතිසංස්කරණය කිරීම) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ප්‍රංශ රජය වෙනුවෙන් නැටික්සිස් බැන්ක් ඔෆ් ෆ්‍රාන්ස් ( NATIXIS Bank of France ) සහ ශ්‍රී ලංකාවේ එවකට මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය අතර අත්සන් කරන ලද ණය ගිවිසුම යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුම්වලට අනුව, එවකට මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ ශ්‍රී ලංකාවේ වානේ පාලම් 46 ක් සපයා ඉදිකිරීමයි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය යුරෝ මිලියන 45.80 කට සමාන රු.මිලියන 7,564 ක් වන අතර ඉන් රු.මිලියන 3,642 කට සමාන යුරෝ මිලියන 22.05 මූල්‍යයනය කිරීම සඳහා ප්‍රංශයේ “ NATIXIS ” බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2013 ජූලි 19 දින ආරම්භ කරන ලද අතර 2015 ජූලි වනවිට නිමකිරීමට අපේක්ෂා කෙරේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. විගණන විෂය පථය හා මතය සඳහා පදනම**

---

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙළ කරන ලද්දකි.මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට

උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරික්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි.පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්,වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව සහ

(උ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**3. මතය**

**--------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව, සහ

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**4.** **මූල්‍ය ප්‍රකාශන**

**4.1** **මූල්‍ය කාර්ය සාධනය**

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.1,263,379,106 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| **විස්තරය** | **2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම** |
|---|---|
| | රු.මිලියන |
| පර්යේෂණ හා සංවර්ධන වියදම් | 19,177,746 |
| ව්‍යාපෘති කළමනාකරණ වියදම් | 15,238,054 |
| ඉදිකිරීම් පිරිවැය | 1,228,963,306 |
| එකතුව | 1,263,379,106 |

**5.** **විගණන නිරීක්ෂණ**

**5.1** **ගිණුම්කරණ අඩුපාඩු**

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ වියදම් ප්‍රකාශනයේ දැක්වෙන ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු රු.187,300,000 ක දායකය ව්‍යාපෘතියේ අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනයේ දැක්වෙන රු.180,800,000 ක් වූ අනුරූපී මුදල සමඟ ගැලපී නොතිබුණි.

**6.** **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**6.1** **අරමුදල් උපයෝජනය**

මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරු අනුව, ව්‍යාපෘති මූල්‍යයනය සහ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් වර්ෂය සඳහා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ සැපයීම සඳහා එකඟ වූ මුදල | | 2013 වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදනය | | 2013 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|---|---|
| | යූරෝ මිලියන | රු.මිලියන | යූරෝ මිලියන | රු.මිලියන | යූරෝ මිලියන | රු.මිලියන |
| විදේශාධාර | 22.05 | 3,642 | 3.00 | 514 | 3.00 | 514 |
| ශ්‍රී ලංකා රජය | 23.75 | 3,922 | 1.13 | 187 | 1.13 | 187 |
| එකතුව | 45.80 | 7,564 | 4.13 | 701 | 4.13 | 701* |

* වර්ෂය අවසානයට ගෙවිය යුතු ශේෂ ඇතුළත් නොකිරීම හේතුවෙන් වාර්තාවේ 4.1 ඡේදයේ දැක්වෙන මුදල සමඟ මෙම මුදල එකඟ නොවේ.

## 6.2 භෞතික කාර්යසාධනය

යූරෝ මිලියන 22.03 ක පිරිවැයකට පාලම් සංරචකයන් සැපයීම සඳහා විදේශ සමාගමක් සමඟ ව්‍යාපෘතිය 2012 දෙසැම්බර් 12 දින කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණි.මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත් ගිවිසුමේ 17 වගන්තිය අනුව, සියලු උපයෝගී උපකරණ සමඟ පාලම් සංරචකයන් දින 730 ක් ඇතුළත සැපයිය යුතු අතර, වැඩ සැලැස්ම අනුව පාලම් 25 ක සංරචකයන් සමාලෝචිත වර්ෂය තුළ සැපයීමට අපේක්ෂා කර තිබුණි.කෙසේ වුවද පාලම් 08 ක සංරචකයන් පමණක් 2013 දෙසැම්බර් 31 දිනට සපයා තිබුණි.

(ආ) කොන්ත්‍රාත් කොන්දේසි අනුව, ඉංජිනේරුවන් 15 දෙනෙකු පුහුණු කිරීමට ව්‍යාපෘතිය අපේක්ෂා කර තිබුණි.කෙසේ වුවද 2014 නොවැම්බර් 30 දක්වා ඔවුන්ට එවැනි පුහුණු පහසුකම් සපයා නොතිබුණි.

## 6.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.මිලියන 59.74 ක පිරිවැයකට හංවැල්ල - පූගොඩ මාර්ගයේ අංක 11/2 දරන පාලම ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තුවක් ව්‍යාපෘතිය විසින් ප්‍රදානය කර තිබුණි.මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුල් ප්‍රමාණපත්‍රවල ඇතුළත් වූ කාර්යයන් සියයට 66 සිට සියයට 70 දක්වා අවස්ථා 5 කදී වැඩිකර තිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස කාර්යයන් හි ඇස්තමේන්තුගත පිරිවැය රු.2,887,600 කින් වැඩි වී තිබුණි.

(ii) ලබා ගත හැකි වූ වාර්තාවලට අනුව, පාලමේ ඉදිකිරීම් වැඩ 2014 මාර්තු 10 දින සම්පූර්ණයෙන්ම නිමකර තිබුණි.කෙසේ වුවද රු.24,190,088 ක පිරිවැයකට ඇස්පල්ට් ඇතිරීම, ඉවුරු පිරවීම, අයින් පුළුල් කිරීම හා ටර්ෆ් වැඩ ආදී ඉදිකිරීම් වැඩ 2014 ජුලි 10 දක්වා සිදුකර තිබුණි.තවද වැඩ සම්පූර්ණයෙන්ම නිම කිරීමෙන් පසුව, සිදුකරන ලද වැඩ මත මිල උච්චාවචනයන් ලෙස රු.765,254 ක මුදලක් ද ගෙවා තිබුණි.

(iii) විගණකවරුන් විසින් කරන ලද වැඩබිම් පරීක්ෂාවේදී, පුනරුත්ථාපන වැඩවල පාලමට කිට්ටුවෙන් මාර්ගය මතුපිට මීටර් 3 ක් පමණ දිගට පිපිරීම් හා පාලමේ මතුපිට සහ අඩි පාරෙහි වර්ග මීටර් 5 කට වැඩියෙන් විශාල වූ වළවල් ආදී දෝෂයන් රාශියක් අනාවරණය විය.

(ආ) තවලම - නෙළුව - බටුන්වන්ගල මාර්ගයේ අංක 9/5 දරන පාලම ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රු.86,743,250 ක මිලකට කොන්ත්‍රාත්කරුවකුට ප්‍රදානය කර තිබුණි.විගණනයේ දී නිරීක්ෂණය වූ කරුණු පහත පරිදිවේ.

(i) ආරක්ෂක ක්‍රියාමාර්ගයන් තහවුරු කරගැනීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ට රු.1,080,000 ක මුදලක් ගෙවා තිබූ නමුත්, සයින් බෝඩ්ස්, බැරිකේඩ් ටේප්ස්, ප්‍රවාහන පාලන ඒකක ආදිය සැපයීම මෙන්ම ආරක්ෂක කබා, සපත්තු, හිස්වැසුම් ආදිය වැඩබිම් වැඩකරුවන්ට සැපයීමට කොන්ත්‍රාත්කරුවන් විසින් පියවර ගෙන නොතිබුණි.

(ii) මාස 11 ක කාලයකට කොන්ත්‍රාත්කරුවන්ගේ ඉංජිනේරුවන් සඳහා වෙනම කාර්යාලයක් පවත්වා ගැනීම සඳහා කොන්ත්‍රාත්කරුට රු.880,000 ක මුදලක් ගෙවා තිබූ නමුත් කොන්ත්‍රාත්කරු විසින් එවැනි කාර්යාලයක් පවත්වා නොතිබුණි.තවද ලිපිකරුවකු හා මුරකරුවන් දෙදෙනෙකු පූර්ණකාලීන පදනම් මත මාස 11 ක් යොදා ගැනීම සඳහා රු.1,080,000 ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබූ නමුත් එවැනි නිලධාරින් බඳවා ගෙන හා සේවයේ යොදවා ගෙන නොතිබුණි.

(iii) වැඩ ආරම්භ කිරීමේදී සඳහා සිදුවූ දින 56 ක ප්‍රමාදය හසුකර ගැනීම සඳහා සංශෝධිත කාර්ය වැඩසටහන් කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) හැටන් - නුවරඑළිය මාර්ගයේ පාලම් අංක 48/2 ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තුව රු.65,234,576 ක පිරිවැයකට සමාලෝචිත වර්ෂය තුළ ප්‍රදානය කර තිබූ අතර මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නොතිබුණි.

(ii) ඉදිකිරීම් වැඩ සඳහා පරිසර අධිකාරියේ හෝ ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානයේ අනුමැතිය ලබා ගැනීම සඳහා ව්‍යාපෘතිය විසින් රු.7,603,239 ක මුදලක් වැයකර තිබුණද එම අනුමැතිය ලැබී නොතිබුණි. නායයාම් සිදුවීමේ හැකියාව මත ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානයේ අනතුරු ඇඟවීම් හේතුවෙන් පසුව පුනරුත්ථාපන වැඩ අත්හැර දමා තිබුණි. අත්හැර දැමූ වැඩ සඳහා වන්දි ලෙස රු.2,018,418 ක ඉල්ලීමක් කොන්ත්‍රාත්කරු විසින් කර තිබුණි.තවද, කොන්ත්‍රාත් කටයුතු ඉක්මණින් නවතා දැමීම හේතුවෙන් රු.8,415,142 ක් වූ වැඩ පූර්ව අත්තිකාරම් ශේෂය හිඟ හිට පැවතුණි.

**6.3** **මතභේදයට තුඩුදෙන කරුණු**

**--------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී කොන්ත්‍රාත්කරු විසින් ණය මුදලින් ප්‍රසම්පාදනය කර තිබූ වාහන, උපකරණ, ලී බඩු ආදී වත්කම් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ඔවුන්ගේ භාරයට ගෙන එහි වටිනාකම් හා වෙනත් විස්තර ලේඛනවලට ඇතුළත් කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු විසින් එම වත්කම් වෙනත් ඉදිකිරීම් කටයුතු සඳහා යොදා ගෙන තිබුණි.

(ආ) ආසන 07 ක ධාරිතාවයෙන් යුත් 2000 cc මගී වැන්රථයක් ප්‍රසම්පාදනය කිරීමට පිරිවිතරයේ අංක 7 වගන්තියේ දක්වා තිබුණද, ව්‍යාපෘතිය විසින් සමාලෝචිත වර්ෂය තුළ ආසන 05 ක ධාරිතාවෙන් යුත් 1300 cc මෝටර් රථයක් ප්‍රසම්පාදනය කර තිබුණි. කෙසේ වුවද, පිරිවිතරය වෙනස් කිරීමට විධිමත් හේතුවක් නොමැතිව රු.1,187,500 ක එකහ වූ මිල සැපයුම්කරුට ගෙවා තිබුණි.

(ඇ) තවද ව්‍යාපෘතිය විසින් කරන ලද රු.2,100,200 ක් වූ වෙන්කිරීම යටතේ කොන්ත්‍රාත්කරු විසින් වාහනයක් ප්‍රසම්පාදනය කර කොන්ත්‍රාත්කරුවන්ගේ ඉංජිනේරුවන් විසින් සිදුකරන අධීක්ෂණ කාර්යයන් සඳහා භාවිතා කිරීමට අපේක්ෂා කර තිබූ නමුත් ව්‍යාපෘති නියෝජ්‍ය අධ්‍යක්ෂ විසින් එය භාවිතා කර තිබුණි.

(ඈ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලයට මූල්‍ය කළමනාකරු තනතුර ඇතුළත් කර නොතිබූ නමුත්, අදාළ තනතුර සඳහා රු.357,500 ක් වූ වැඩ බැලීමේ දීමනා, ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයේ නිලධාරියකුට ගෙවා තිබුණි.තවද නිලධාරියාගේ පැමිණීමේ වාර්තා සඳහා සාක්ෂි විගණනයට ලැබී නොතිබුණි.